ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.ප./ලි/001

2017 ජනවාරි 11 | යොමු අංකය 1617-024

දයාබර දෙමාපියන් වෙත,

**<u>විශේෂ රැස්වීම - තාවකාලිකව නවත්වන ලද දහම් පාසැල් අධ්‍යයන කටයුතු නැවත ආරම්භ කිරීම</u>**

දහම් පාසලේ දෙමාපියන් වෙත 2017 ජනවාරි 10 දින 1617-023 දරණ දැන්වීමෙන් දන්වා එවූ පරිදි දහම් පාසල **<u>ජනවාරි 20 දින</u>** නැවත ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අනිවාර්යයෙන් ක්‍රියාත්මක කලයුතු වැඩ පිළිවෙල සම්භන්ධයෙන් සහ දෙමාපියන් විසින් අනිවාර්යයෙන් පිළිපැදිය යුතු නව කොන්දේසි මාලාව පිළිබඳව ඔබ සියලු දෙනා දැනුවත් කිරීම සඳහා ගරු කොන්සල් ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් විශේෂ රැස්වීමක්;

**2017 ජනවාරි 13 සිකුරාදා දින**

**පෙ ව 9.00 සිට පෙ ව 11.00 දක්වා**

ඩුබායි හි **Emirates English Speaking School ශ්‍රවනාගාරයේ දී** පැවැත්වෙන බව දන්වා සිටිමු.

පාසල පිහිටා ඇති ස්ථානය: Location of School (near Safa Park)

ඉහත සඳහන් කර ඇති දැන්වීමෙන් දන්වා එවූ පරිදි දහම් පාසලේ අධ්‍යාපනය ලබන සියලුම දරුවන්ගේ දෙමාපියන් මෙම රැස්වීමට **<u>අනිවාර්යයෙන් සහභාගී විය යුතු අතර තම දරුවන් නැවත ලියා පදිංචි කිරීමද</u>** කල යුතුය. නැවත ලියාපදිංචි කරන දරුවන් හට විශේෂ හැඳුනුම් පතක් නිකුත් කරනු ඇත. ජනවාරි මස 20 සිකුරාදා නැවත ආරම්භ වන දහම් පාසලට ඇතුලත් කරගනු ලබන්නේ මෙම හැඳුනුම් පත සතු දරුවන් පමණක් බව අවධාරණය කර සිටිමු.

මේ සමග **<u>අමුණා ඇති කොන්දේසි සහිත පත්‍රිකාව</u>** හොඳින් කියවා, අත්සන් කර රැස්වීමට පැමිණෙන විට රැගෙන විත් සංවිධායක මණ්ඩලයට භාර දෙන්න.
**<u>දරුවාගේ ශිෂ්‍ය වාර්තා පොතද</u>** මෙම රැස්වීමට පැමිණෙන විට රැගෙන එන්න.

රැස්වීම පෙ ව 9.00 ට ආරම්භ කිරීම සඳහා කරුණාකර පෙ ව 8.45 ට ප්‍රථම ශාලාවේ අසුන් ගන්න.

ස්තුතියි,
සංවිධායක මණ්ඩලය

Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.
TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org